


"කවද්ද උඹ ආවෙ?"

"දැන් කවද්ද යන්නෙ ?"

හොඳ පදමට මීවිතකින් පදම් වෙලා උන්නු පන්හිඳගෙයි, පින්සලගෙයි, පැන්සලගෙයි පන්ති මිත්‍රයෙක් ලංකාවේ ආදි ශිෂ්‍යයින්ගේ සාදය තිබුණු රෑ පුරාවට ම පන්, පින්, පෑන් දකින ගානෙ අහපු එක ම ප්‍රශ්ණ දෙක තමයි ඔය.

මෙහේ ඉඳන් නිවාඩුවට ලංකාවට ගියාම හැමෝ ම අහන ප්‍රශ්ණ දෙකක්නෙ ඔය. සමහරු ඔය අතරට වෙන ප්‍රශ්ණත් අහනවා. ආ-ගිය තැන්, යන-එන හැටි, කන-බොන දේ, ජීවත් වෙන හැටි, කාලගුණය, දේශගුණය, දේශපාලනය රටතොට තොරතුරු, ඔකී නො කී දේ.......

බීලා. ඒ වගේ ම තමයි අධ්‍යාපනය, හැදියාව, සාරධර්ම, ආගම, භාෂාව...... කෙටියෙන් කිව්වොත් සංස්කෘතිය. මේ දේවල් අරගෙනයි අපි මෙහෙ ආවෙ. ඇවිත් මෙහේ අයත් එක්ක කටයුතු කරන්නෙ. ඒ අධ්‍යාපනය, පළපුරුද්ද මුල් කරගෙන තමයි රස්සාවල් කරලා හරි-හම්බ කරගන්නෙ. දරු පවුල් රකින්නෙ. මෙහෙ වැඩි දුර අධ්‍යාපනයට වුණත් මුලින් ඉගෙන ගත්තු දේ බලපාන්නෙ නැද්ද? නොමිලේ ලැබුණ අධ්‍යාපනයට පින් සිද්ධ වෙන්න ලෝකෙ කො-හේ ගියත් පය ගහලා ඉන්න දණිස් වලට පණ ලැබුණා. "පන් කියාගෙන කියාගෙන ගියා.

මව් රටේ ඒ සමාජයෙන් සාධාරණයක්, යුක්තියක් ඉෂ්ඨ වුණා ද කියන එක....! "

"තමන් ට පෞද්ගලිකව අසාධාරණයක් වුණ පළියට අර ඔක්කොම නිකං ලැබුණ දේවල් අමතක කරන්න පුළුවන් ද?"

# ආව-ගියෝ



ඒත් බොහො ම දෙනෙක් ඔය අතරට පුරවන්නේ තමුන්නේ තොරතුරු, දුක් ගැනවිලි, පම්පෝරි පිට රටක ඉඳන් ඇවිත් කාලෙකින් මුණ ගැහුණ උන් කාලා-ඇඳලා ඉන්නවාද කියලවත් දැනගන්න වගක් නෑ. කාලා ඇඳලා ඉන්න බව පේන නිසා වෙන්නත් පුළුවන්. මොනවා තිබුණත් තමුන්ගේ අය එක්ක ඉන්න ඒඅ යට තිබෙන සතුට, නිදහස රට ගිය ඇත්තන්ට ඒ තරමට ම නැතිබව දන්නෙ කීයෙන් කී දෙනා ද?

"තමන් උපන්න රට අමතක කරලා ඇඟ බේරාගෙන වෙන රටකට පැනගත් අය හැටියට නේ අපිව ගණන් අරන් තියෙන්නේ සමහර අය" පැන් කිව්වේ නෙ-ා්ක්කාඩුවක් විදියට.

"අපට චෝදනාවකුත් තියෙනවානේ......" ඒ පන්.

"මොකක් ද අප්පේ ඒ......?
පින්ට ප්‍රශ්ණයක්.

"නිදහස් අධ්‍යාපනය ලබලා රටට සේවයක් නො කර වෙන රටවල් වලට ඒ දැණුම විකුණලා සැප විඳිනවා කියලා......

"සාකච්ඡාවකට හොඳ මාතෘකාවක්. මොකද ඒ කතාවෙන් ඇත්තත් නැත්තෙ ම නෑනේ..... ඒක අහපුවාම මටත් නිකං "ගිල්ටි මයින්ඩ්" එකක් ආවා. පැන් කල්පනාවට වැටුණා.

"ඔය දේවල් වලට උත්තර බඳින්න යන එකෙන්, අපි කළ දේ සාධාරණීයකරණය කරගන්න උත්සාහ කරන එකෙන් ඇති වැඩේ මොකක්ද ?" පින් ඔළුව කැසුවා.
"ඒ වුණාට හිතන්න යමක් එහේ ඉන්න අයටයි මෙහේ ඉන්න අයටයි දෙගොල්ලන්ට ම තියෙනවා. ඒ නිසා ඒ ගැන විවෘතව කතා කළාට කමක් නෑ......" පැන් යෝජනා කළා.

"අම්ම කෙනෙකුට වෙච්ච ණය දරුවෙකුට කවදාවත් ගෙවලා ඉවර කරන්න බෑ. ඒ වගේ ම තමයි මව් රටට වෙලා තියෙන ණයක්. අපේ ඇගට ලේ ඉනුවේ ලංකාවෙ සරු පසේ හැදුණ දේ කාලා. ඒ පොළවෙන් උණාපු වතුර

"අපිට ඒවා අමතක කරන්න පුළුවන් ද? ඇත්තට ම අපිට ඒ ණයෙන් කොටසක්වත් ගෙවන්න පුළුවන් ද?

"අමතක කරන්න නම් බෑ තමයි. හැබැයි ඉතින් ණය ගෙවන එකනම් බෑ-බෑ කියලා බෑ-බෑ-බෑ කිව්වොත් බෑ ම තමයි. පැන් උත්තර බැන්දා.

"මව්බිමෙන් ලැබුණ දේවල් ගැන මතක් වෙන කොට තමන් හිතට එකඟව හිතන්න ඕන කාරණයක්/තියෙනවා. ඒ තමයි තමුන් මව්බිමේ ඉන්න කාලෙදිවත් තමුන්ගේ හෘද සා-ක්ෂියට එකඟව රට වෙනුවෙන් කළ යුතු දේ කළා ද කියන එක. කළානම්, අන්න එහෙනම් එතන පොඩි ගැලවිල්ලක් තියෙනවා."

"හිතට එකඟව යුතුකම් කරගෙන උන්න කෙනෙක් ඇයි එහෙනම් පිටරට පනින්නේ?

"එතෙන්දි හිතන්න ඕන කාරණය තමයි තමන් යුක්ති සහගතව සාධාරණව ජීවත් වෙන එකට

"ඒත් ඒ මඩ ගොහොරුවේ ම ඉඳලා ගැලවිල්ලක් ගොඩ ඒමක් නැත්තං? විකල්පයක් නැත්තං? පුළුවන්කමක් තියෙනවනං තමන් හරි ඒ වලෙන් ගොඩට ඇවිත් අනිත් අයටත් පුළුවන් හැටියෙන් උඩට එන්න උදව් කරන්න උත්සාහ කරන එක වැරැද්දක් ද?

"සමහරු උදව් කරනවා කියලා කරන්නේ බේද බින්න කරවන එක. විෂබීජ පතුරවන එක. ඒ දේවල් වලටයි පිටරට ඉඳන් උදව් කරන්නෙ. ඒක හරියට මෙහේ ඉඳන් එහේ අශ්වයෝ දුවවනවා වාගේ වැඩක්. මේ අය සල්ල විසි කරනවා. එහේ අය කා කොටා වැටෙනවා. දුක් විඳින්නේ එහේ අය. මෙහේ අයට මේක සුදුවක්."

"ඒ වුණාට රටකට වෙන අනර්ථය ඒ රටේ ඉන්න අයට වඩා හරියට දකින්නෙ පිට ඉන්න උදවිය. ඒ උදවියට නිවැරදි ප්‍රවෘත්ති ලැබෙනවා. රටේ අය දකින්නේ බලයේ ඉන්න උදවිය කප්පාදු කරලා පෙන්නන දේ විතරයි. ඉතින් ඒ මත්තේ ඉඳගෙන එක එකා පැටලෙනවා."

"මේ පාර ලංකාවට ගියා ම වෙන මාතෘකාවක් තිබුණාද දේශපාලනය, ඡන්දය ඇරෙන්න? හුඟක් දෙනෙකුට අපි ගියේ කවද්ද, ආපහු එන්නෙ කවද්ද කියන සුපුරුදු ප්‍රශ්ණ දෙන අහන්නවත් සිහියක් තිබුණේ නෑ. ගෙදරකට ගොඩ වුණ වෙලාවේ ඉඳන් කතා කළේ දේශපාලනේ, අපි ඉතින් ඒ අය දුන්න දෙයක් කාලා බීලා, ඒ අය කියපු දෙයක් අහගෙන ඉඳලා ආවා. අපි රට ගැන කියන දෙයකටවත් කන් දෙන්න ඉස්පාසුවක් තිබුණ ද?"

"ඒ කන් හරියට රූපවාහිනිය දිහා බලා උන්නා වගේ, පත්තරයක් බැළුවා වගේ, රේඩියෝ එකක් ඇහුවා වගේ අපි කියන- දෙයක් අහන්න, බලන්න කෙනෙක් හිටියෙ නෑ."

"ඒකට මව් රටේ ඉන්න අපේ උදවියට බැණ අඩගහලා වැඩක් නෑ. ජරාජීර්ණ දේශපාලනය ඒ අයගේ ජීවිත වලට කා වැදිලා. හැම දෙයක් ම රඳා පවතින ප්‍රධාන සාධකය දේශපාලනය බවට පත් වෙලා. ඒකට ඉතින් අපට මෙහේ ඉඳන් කරන්න පුළුවන් දෙයක් තියෙනවාද? තමන්ගේ අනාගතය තීරණය කරගන්න වෙලා තියෙන්නේ ඒ අයටමයි. පන් කිව්වා.

"වාසනාවකට හරි අවාසනාවකට හරි ඒ අයටමයි ඒ අයටමයි ඒක පුළුවන් "පැන් උෘණ පූර්ණය කළා.

"හොඳ-නරක" දෙක කාටත් තියෙනවා. කොහෙත් තියෙනවා. කොයි වෙලාවෙත් තියෙනවා. ඒ දෙක තරාදියකට දාලා කිරලා බලලා තීරණයක් ගත්තා නම් මේ වෙන වෙන කොට ඒ තීරණය ගැන දැනගන්න පුළුවන්. කවදා කවුරු ආව-ගියත් දුක් විඳින්නෙ රටේ ඉන්න අය.

"මොනවා වුණත් ඒහේ-මෙහේ කොහේ උන්නත් අපි අපි අවුරුද්දක් මුලදි කරන ප්‍රාර්ථනයක් තියෙනවානේ. අපි ඒක කරමු."

"ලබන්නා වූ 2015 නව වසර කිරියෙන් පැණියෙන් ඉතිරෙන නව වසරක් වේවා!"

පන්,පින්,පැන් තුන්දෙනාම මේ දේවල් කියවන හැමෝටමත් අනික් හැම දෙනාටමත් ප්‍රාර්ථනා කළා.




